# 10 ශ්‍රේණිය

# සිංහල

## බැද්දේගම







The National e-learning Portal for the General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

අනුවර්තනය

ඒ. පී. ගුණරත්න මහතා





The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

මුල් කෘතිය - Village in the jungle ( 1931 )







කතුවරයා - ලෙනාඩ් සිඩ්නි වුල්ෆ් ( 1880 – 1969 )


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# ඒ. පී. ගුණරත්න මහතාගේ වෙනත් පරිවර්තන කෘති

" වානරයා "

" වන සරණ "




" මැකී ගිය දඩමං "

" සුදු ගෝනා "


Copyright © e-thaksalawa.moe.gov.lk

## බැද්දේගම නව කතාවේ එන ප්‍රධාන චරිත.

- සිලිඳු
- පුංචිමැණිකා
- බංබහාමි ආරච්චිල
- හින්නිහාමි
- බබුන්
- වෙදරාළ


Copyright © e-thaksalawa.moe.gov.lk

## පාඩමේ සංක්ෂිප්තය

මහෙස්ත්‍රාත් විභාගයෙන් සිලිඳු මරණීය දණ්ඩනයට නියම වීමෙන් පුංචිමැණිකා හා කර්ලිනාහාමි එදා වේල සපයා ගැනීමට පවා නොහැකිව සිටින අතරතුර දී තමන්ට ජීවත්වීමේ මග වැරදී ඇති බව පුංචිමැණිකා වටහා ගනියි. මිත්‍යා විස්වාස හා පරෝපකාරයෙන් තොර මිනිසාට ම එරෙහිවන මිනිසුන් වෙසෙන ගමෙහි වාසය කිරීමට පුංචිමැණිකාට ඉතිරිව ඇති එකම පිළිසරණ බබුන් බව ඈ වටහා ගනියි. ඇය තව තවත් අසරණ කරවන කතා ගැමියන් පවසද් දී ඇය තමන්ගේ අවසාන බලාපොරොත්තුව ඉටු කරගත හැකි ද යන්න සොයා බැලීමට බොහෝ වෙහෙස දරමින් තංගල්ලේ සිර ගෙදරට ගොස් බබුන් පිළිබඳව විමසයි. එයින් සිය අවසන් බලපොරොත්තුව ද බිඳ වැටීමෙන් අනාගතයත් අහිමි තැනැත්තියක් සේ අසරණව නැවත ගමට යාමට පිටත් වෙයි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk





The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# “බැද්දේගම” රස විඳීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු

1. චරිත නිරූපණය
2. දෘෂ්ටිකෝණය
3. කතා වින්‍යාසය
4. කතා විකාශනය
5. අවස්ථා හා සිද්ධි නිරූපණය
6. භාෂාව
7. ජීවන දෘෂ්ටිය

වැඩිදුර විස්තර සඳහා ඉදිරියෙන් ඇති ඊතලය ක්ලික් කරන්න


Copyright © e-thaksalawa.moe.gov.lk

පුංචිමැණිකාගේ චරිතය

කර්ලිනාහාමිගේ චරිතය

වැඩිදුර විස්තර සඳහා ඉදිරියෙන් ඇති ඊතලය මත ක්ලික් කරන්න

ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# පුංචිමැණිකාගේ චරිතය

- ස්වාමි භක්තියෙන් යුතු බිරිඳකි.

" කොහොම ද ? මම එයාගෙ නම කියන්නෙ අයියා ...... "

ගැමි හික්මීමෙන් ශික්ෂණය වූ ඇ ස්වාමියාගේ නාමයෙන් ඔහුව හැඳින්වීමට නොපෙළඹෙන්නේ ස්වාමි භක්තිය නිසා ය.

- ස්වාමියා පිළිබඳ අසීමිත විශ්වාසයක් හා අපේක්ෂාවක් ඇත්තියෙකි.

" අයියා දැන් කීවනේ මගෙ මිනිහ දන්නවයි කියල? .......එයා මෙහෙ ඉන්නවද ? එයාට මොකද වුණේ? ...... "

ඉතා අපහසුවෙන් තංගල්ලට ගොස් මෙලෙස විමසීමෙන් මේ බව තහවුරු වේ.




Copyright © e-thaksalawa.moe.gov.lk

## පුංචිමැණිකාගේ චරිතය

- නිහතමානී ගති පැවතුම් ඇති තැනැත්තියෙකි.

" පුංචිමැණිකාගේ කළබල නැති ගතියත්, සාන්ත බව හා යටහත් පහත් ගතියත් කවුරුත් ඈ ප්‍රිය කළා ය. පුංචිරාල පවා කීවේ ' පුංචි මැණිකා මුවැත්තියක් වගේය' කියා ය. "

මෙයින් පැහැදිලි වන්නේ ඇය සතු හික්මුණු, යටහත් පහත් ගති ගුණ නිසා ගමේ කවුරුත් ඇයව ප්‍රිය කළ බවයි.

- දැඩි දුක් විද දරා ගැනීමේ හැකියාව ඇති තැනැත්තියෙකි.

" පුංචිමැණිකා නිශ්ශබ්දව ම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇන තියා ගැනීම ..........සාමාන්‍ය අන්දමට ශෝකය ප්‍රකාශ කිරිමට ඇගේ සිතට වැදුණු පහර තද වැඩි ය. "

හිරපල්ලාගේ ප්‍රකාශයනේ තමාගේ අවසන් බලාපොරොත්තුව ද බිදවැටුණ නමුත් ඉන් ලද කම්පාව නිහඬව මෙන් ම තනිව විද දරාගැනීමෙන් මෙය තහවුරු වේ.

ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## පුංචිමැණිකාගේ චරිතය

- අභියෝගවලට මෙන් ම ජීවන අරගලයට මුහුණ දීමේ ආත්ම ශක්තිය ඇති තැනැත්තියෙකි.

" බාලප්පුගේ, පුංචිරාලගේ හේන්වල පවා ඇ වැඩ කළා ය. පින් තකා ඇයට දුන් කුරක්කන් අහුරු කීපයකට ඇ බොහෝ වෙහෙස වී වැඩ කළ යුතු වූවා ය. "

" නන්නාදුනන නගරය පසු කරමින් භීතියෙන් යුතුව සැමියා සොයා සිරගෙදරට යාම. "

මෙම උපුටාගැනීම්වලට අනුව පැහැදිලි වන්නේ කර්ලිනාහාමිගේ හා සිය ජීවිතය පවත්වා ගැනීමට ඇය වෙහෙස වී වැඩ කළ බවයි. එමෙන් ම ස්වාමියා ගැන තොරතුරු දැන ගැනීමට නුහුරු නුපුරුදු ක්‍රියාවන්හි නිරත වූ බව ද පැහැදිලි වේ. මේ අනුව අභියෝගවලට නොපැකිළව මුහුණ දිය හැකි තැනැත්තියක් ලෙස පුංචිමැණිකා හඳුනා ගත හැකි ය.

**ඇය පිළිබඳව පාඨකයාගේ සිත්හි අනුකම්පාවක් ජනිත වන සේ කතාව රචනා වී ඇත.**

ආපසු ඊළඟ



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## කර්ලිනාහාමිගේ චරිතය

➢ දුෂ්කර කැලෑ ජීවිතයේ ලක්ෂණ ඇගෙන් විද්‍යමාන වේ.

“ ඇගේ සම ඇටයට ඇලී රැලි වැටී ගියේ ය. ලැම වියලී ගොසිනි. ”
“ තද සුළඟට ඇඹරී ඇටුවන් බැඟී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ. ”
“ සම ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය. ”

මෙම උදාහරණ මඟින් පැහැදිලි වන්නේ ඇයගේ පෙනුමෙන් ම වැහැරුණු දුක්ඛිත ජීවන ස්වභාවයක් හෙළිවන බවයි.

➢ කුසගින්නෙන් හා රෝගවලින් දුක් විඳියි.

“ අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි. ”

ආපසු


e තක්සලාව
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



ආපසු



Copyright © e-thaksalawa.moe.gov.lk

## කර්ලිනාහාමිගේ චරිතය

- චින්තන ශක්තියෙන් හීන තැනැත්තියකි.

“ ශරීරයට පෙර සිත නැති වී යෑම ......ගැහැනුන් අතර බෙහෙවින් දක්නට ලැබෙන ධර්මතාවයකි. ”

- ඉතා දුර්වල ඉන්ද්‍රියන්ගෙන් යුත් අයෙක් බවට පත්වෙයි.

“ අප්‍රාණික පටල සහිත දෙනෙත රැළි වැටුණු නළල් තලයට යටින් සිය ගණන් රැළි ගිලී තිබිණ. දෙනෙත අන්ධව නොතිබුණත් පෙනීමක් නැති සේ ය. මැලවී ගොසිනි. ”


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## දෘෂ්ටිකෝණය

ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් කතාව විකාශනය වේ
( කතාව කියනුයේ කතුවරයාගේ මුවෙනි )


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## කතා වින්‍යාසය

මුල, මැද, අග ආදී වශයෙන් ඒකීය ධාරණාවකින් කතා වින්‍යාසය සැකසී ඇත.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## කතා විකාශනය

**හේතුඵල සම්බන්ධතාවය අනුව කතාව ගලා යයි.**
(අවස්ථාවන් අතර සම්බන්ධතාවයකින් යුක්තව කතාව විකාශනය වේ. )

- ✓ බොරු නඩුවකින් බබුන් සිරගත කරනු ලැබීම.
- ✓ සිනිදු මරණීය දණ්ඩනයට ලක්ව සිරගත වීම.
- ✓ එනිසා පුංචි මැණිකා හා කර්ලිනාහාමි තනි වීම.
- ✓ බංබෙහාමි ආරච්චිලගේ මරණයත් සමඟ ආරච්චිලගේ බිරිඳ ගම අතහැර යාම.
- ✓ ක්‍රමිකව ගම පාළුවට යාම.
- ✓ පුංචි මැණිකා බබුන් පිළිබඳව සෙවීමට සිරගෙදර කරා යාම.

ආපසු
ඊළඟ


Copyright © e-thaksalawa.moe.gov.lk

## අවස්ථා හා සිද්ධි නිරූපණය

1 බබුන් හා සිනිදු සිරගත වීමෙන් පසුව පුංචි මැණිකා හුදකලා වූ අවස්ථාව

"බබුන් සිරගෙට නියම වීමත් ඇගේ පියා ඇට නැති වීමත්, පියාගේ ඉරණම පිළිබඳව ඇගේ සිතේ පැවැති බියත් නිතර ඇගේ දුක හා දොම්නස ද දියුණු කළේ ය. "

2 කර්ලිනාහාමි දුර්වලව ගිය අවස්ථාව

"ඇගේ සම ඇටයට ඇලී රැලි වැටී ගියේ ය. ළැම වියළී ගොසිනි."

" තද සුළඟට ඇඹරී ඇටුවන් බැඟී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ. "

"සම ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය. "

ආපසු



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## අවස්ථා හා සිද්ධි නිරූපණය

3 ආරච්චිගේ නිවස ගරා වැටීම.

“ බිත්තිවල තැනින් තැන මැටි ඇද වැටීමෙන් වරිච්චි කොටු නෙත් සුළඟට අසුවී නිසා ඉනි මුල්ඇද දලු රිකිලි ලා වැඩෙන්නට වන.”

“ ලොකු දළුක් පඳුරක් වහල මත වැටී උළු එහා මෙහා කරමින් මුල් ඇදුණේය.”

“ කුඩා රතු උළු ගොඩ තණ හා වල් පඳුරුවලින් වසා ගත්තේ ය. ”

“තුන්වැනි වැස්ස අවසානයේ දී මුළු වත්තත් ගෙයිත් කැළයේත් වෙනසක් නොවී ය. ”

ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## අවස්ථා හා සිද්ධි නිරූපණය

4 මහත් අපේක්ෂාවෙන් යුතු පුංචිමැණිකා පුංචිරාලගෙන් බබුන් ගැන විමසා ඇය අසරණත්වයට පත්වන අයුරු

" පුංචිරාමැණිකාගේ හද දෙදරුම් කෑවේ ය. ඈ තමාගේ ලොකු ඇස් දෙක වෙදරාළගේ මුහුණට හෙළා ගමන් නො සැලී සිටියා ය. "

5 නන්නාඳුනන මගක් ඔස්සේ පුංචිමාණිකා හිරගෙදරට යන අයුරු

" බියපත් සිවල් දෙනක මෙන් බියෙන් ඇලළී ඇකිළී යන ඇගේ තනිකම ඇයට දැනුණේ වඩාත් බලවත් ලෙසිනි..........රෑ බෝ වී බඩ ගින්නත් තෙහෙට්ටුවත් වැඩි වන විට මග අසල කුඩා ලැහැබකට රිංගා නිදා ගැනීම මැනැවැ යි ඈ සිතා ගති . "

ආපසු


Copyright © e-thaksalawa.moe.gov.lk

## අවස්ථා හා සිද්ධි නිරූපණය

6 පුංචි මැණිකා හිර ගෙදර සොයමින් විමසිලිමත් වන අවස්ථාව සංකේත මගින් ඉදිරිපත් කරයි.

"එළදෙන යමෙකු සොයමින් මාපොළොව තොලූ ගාන්ට වන. "
( පුංචි මැණිකා එළදෙනගෙන් සංකේතවත් කරයි. ඇ බබුන් සොයයි. එළදෙන ද යමෙකු සොයයි. )

7 පුංචි මැණිකාගේ පියා සිහිගන්වන මහල්ලාගෙන් තොරතුරු විමසන අවස්ථාව .

" සීයෙ අර පේන්නෙ හිර ගෙදර ද?....'මගෙ මිනිහ ඒක ඇතුළෙ වෙන්ඩ පුළුවනි'.....එයා මාස හයකට හිරගෙදරට නියම වුණා. දැන් මාස හය පහුවෙලා. ඒත් එයා ගමට ආවෙ නෑ.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# බැද්දේගම





ආපසු


Copyright © e-thaksalawa.moe.gov.lk




ආපසු


Copyright © e-thaksalawa.moe.gov.lk




ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

1 අවස්ථා නිරූපණයට උචිත භාෂාව යොදාගත් ආකාරය.

2 අදහස් දැක්වීමේ දී යථාර්ථවාදීව භාෂාව හසුරුවා ඇති ආකාරය.

3 සංකේතාත්මක භාෂාව යොදා ගැනීම.

4 අදහස් මතු කරවන උපමාර්ථවත් භාෂාව.

5 අවස්ථානුකූලව ධ්වනිථාර්ථවත් භාෂාව යෙදීම.

6 ගැමි බස් වහරින් පෝෂිත භාෂාව.

7 කෙටි වැකිවලින් යුත් සංවාදාත්මක භාෂාව.

වැඩිදුර විස්තර සඳහා ඉදිරියෙන් ඇති ඊතලය ක්ලික් කරන්න

ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

1 අවස්ථා නිරූපණයට උචිත භාෂාව යොදාගත් ආකාරය.

නිදසුන් -

"පුංචි මැණිකා .... බැද්දේගම පුරුදු නිදිබර උදාසීන ස්වභාවය ම ඉසිලුවා ය."

"භයානක අවිනිශ්චිත අඳුරු අනාගතය විසින් ඈ නොසන්සුන් බවට පත් කරන ලද්දී ය."

" හොඳයි කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවනෙ "



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

2 අදහස් දැක්වීමේ දී යථාර්ථවාදීව භාෂාව හසුරුවා ඇති ආකාරය

නිදසුන් -

‘‘අව්ව හා සුළඟත් වොහසත් බඩගින්නත් ලෙඩ දුකුත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි. ඇගේ සම ඇටයට ඇලී රැලි වැටී ගියේ ය. ළය වියලී ගොසින. ’’

‘‘අළු පැහැති කොළ හා දම් පැහැති මල් ඇති වරා පඳුරු හා මානා පඳුරු ද වැට අද්දරින් රිංගා අවුත් මිදුලටත් ගෙයි බිත්තිවලට හා දොරකඩටත් ළං විය. ’’

ආපසු



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

### 3 සංකේතාත්මක භාෂාව යොදා ගැනීම.

පුංචි මැණිකා හිර ගෙදර සොයමින් විමසිලිමත් වන අවස්ථාව සංකේතාත්මක ව මගින් ඉදිරිපත් කරයි. ( පුංචි මැණිකා එළදෙනගෙන් සංකේතවත් කරයි. ඇ බබුන් සොයයි. එළදෙන ද යමෙකු සොයයි. )

නිදසුන් -

" ඔහුගේ දෙනෙත එළදෙනෙක කර යොමු විය. එළදෙන ඇස් නෙරවා දික් කරගෙන නිශ්චලව සිට කහින්නට පටන් ගති. දැල හකුළුවා ගෙන ඇ කැස්සේ ඉතා වේදනාවෙනි. කැස්ස නතර වුණු පසු එළදෙන යමෙකු සොයමින් මහපොළොව තොලු ගාන්ට "

ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

4 අදහස් මතු කරවන උපමාර්ථවත් භාෂාව.

නිදසුන් -

" හොඳයි කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවනෙ "

" මේ ගෙය වනයට විරුද්ධ ව දිගු සටනක යෙදී සිටින සේ "

" පුංචිමැණිකා මුවැත්තියක් වගේ "

" කෙළවලින් තෙමුණු රේඛාවක් ලෙසිනි "



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

5 අවස්ථානුකූලව ශබ්ද ධ්වනිය මතුවන භාෂාව යෙදීම.

නිදසුන් -

“ හැම දෙනෙක්ම එකට කතා කළහ. එකට කෑ ගැසූහ. අත් පා සැලූහ. වෙළෙඳාම් පොලේ ශබ්දය පුංචි මැණිකාගේ බිය දියුණු කළේ ය. ”

“ ඔවුහු කෑම කති. නිදා ගනිති. කිසිවෙකු සමඟ කතා නොකරති. ”

“ වැපිරුවා විතරනෙ දැන්. නෑ නෑ නෑ තුන් මාසෙකට කලින් වෙන් ඕනෑ ”

“ මොඩයා කවුද දන්නෙ? නෑ මෝඩයා. කට වහපන් ! කට වහපන් ! තමන්ගේ පැල්පතයි, මිදුලයි, කැලෙයි තමන්ට නිදහසේ තියෙනවා. මේවායේ ඝෝෂාවයි, කලබලයයි, කරදරෙයි විතරයි නිමාවක් නැති දේවල් ”( ගම හා නගරයේ වෙනස දැක්වීම )

ආපසු

ඊළඟ



e තක්සලාව The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## භාෂාව

6 ගැමි බස් වහරින් පෝෂිත භාෂාව.

නිදසුන් -

" තොලුගාන්ට, නිම්මාවකින් නැතුව, හිර ඉසලන් ගැනීම, ඇටුවන් බැහී කෙළින් කටින් සිටින්නට, ඉවර වී. "

7 කෙටි වැකිවලින් යුත් සංවාදාත්මක භාෂාව.

නිදසුන් -

" එයා මැරිල සීයෙ"

" ඔව් ඕකට ගිය කෙනෙක් ආයෙ එන්නෙ නෑ. උඹ පලයන් ළමයා ආපහු ගමට."

" මම යනව සීයෙ"

ආපසු


Copyright © e-thaksalawa.moe.gov.lk

## 7 ජීවන දෘෂ්ටිය

තමන්ගේ ජීවන වට පිටාවේ වුව ද නිදහසේ ජීවත්වීමට අවස්ථාව ලැබෙනුයේ ඒ ඒ තැනැත්තන් හා සහජීවනයෙන් ජීවත්වීම තුළින් පමණි. එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික අමුණු තහවුරු තර ගැනීමට උත්සාහ කිරීමෙන් සිදුවන්නේ අනපේක්ෂිත විනාශයන්ට මුහුණදීමට ය. මේ අනුව බලවතුන්ගේ, ස්වභාව ධර්මයේ, මිත්‍යා විස්වාසයන්ගේ මෙන්ම නිළධාරී පැලැන්තියේ සහ ඒක පාර්ශවීය අයුරින් ක්‍රියාත්මක වන නීති පද්ධතියට යටත්වන බැද්දේගම වැසියන්ගේ අසරණ දු:ඛාන්තය මානුෂ්‍යත්වයෙන් පිරි පාඨක සිත්හි අනුකම්පා සහගත කම්පනයක් ඇති කරයි. ඔවුන්ට යුත්තිය ඉටු නොවූ හෙයින්, එම යුත්තිය ඉටු කිරීමේ අවශ්‍යතාව පාඨක සිත්හි ජනිත වෙයි. නමුත් ඒ වන විට බැද්දේගම විනාශ වී අවසන් ය. මිනිසාගේ පැවැත්ම සම්බන්ධව නැවත සිතා බැලීමට මෙම නවකතාව පාඨකයාව මෙහෙයවයි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




ආපසු

# සමාප්තයි.


Copyright © e-thaksalawa.moe.gov.lk